www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ පිරිහීම

## The decline of social democracy

**2009 ජූනි 10**

පසුගිය සති අන්තයෙහි පවත්වන ලද යුරෝපීය මැතිවරනයෙහි වඩාත්ම සැලකිය යුතු ප්‍රතිඵලය වූ කලි සමාජ ප්‍රජාතන්ත්‍රවාදයෙහි විශ්මය ජනක පිරිහීමයි.

යුරෝපය පුරා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ ලැබූ ඡන්ද සංඛ්‍යාවෙහි සාමාන්‍යය මුලු ඡන්ද ප්‍රමානයෙන් සියයට 22ක් පමනි. කලින් පවත්වන ලද 2004 වසරේ යුරෝපීය මැතිවරනයෙහි සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ ලැබූ ඡන්ද ප්‍රමානය හා සසඳන විට මෙය සියයට 6කින් පහත වැටීමකි. ඡන්දය ප්‍රකාශ කල මුලු සංඛ්‍යාව යාන්තමින් සියයට 43ක් විය. ඒ අනුව සලකා බැලූ කල පෙනීයන්නේ මෙම පක්ෂවලට ඡන්දය දී ඇත්තේ ඡන්ද දායකයන් දස දෙනෙකුගෙන් එක් අයෙකු පමනක් බවයි.

යුරෝපීය ප්‍රකාශිත ඡන්ද සාමාන්‍යයෙහි සංඛ්‍යා සැබෑ පිරිහීමෙහි ප්‍රමානය විකෘති කරයි. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ දශක ගනනාවක් පුරා ආන්ඩු බලය දැරූ හෝ ප්‍රධාන විපක්ෂය වශයෙන් ක්‍රියා කල බටහිර යුරෝපයෙහි ප්‍රධාන කාර්මික රටවල් තුල ඔවුන් ලත් පරාජයන් ඉමහත් ය. මෙම පක්ෂ වර්තමානයෙහි ආන්ඩු කරන හෝ විපක්ෂය වශයෙන් ක්‍රියා කිරීම නොතකා එසේ සිදු විය.

පසුගිය දොලොස් වසර තුල කම්කරු පක්ෂය බලය හෙබවූ මහා බ්‍රිතාන්‍යයෙහි, එම පක්ෂයට දක්වන ලද සහාය සියයට 16ක් දක්වා ප්‍රපාතාකාර ලෙස පහත වැටුනි. කම්කරු පක්ෂයට ලැබුනු ඡන්ද සංඛ්‍යාව එක්සත් රාජධානියේ අන්ත දක්ෂිනාංශික ස්වාධීන පක්ෂයකටත් වඩා අඩු විය. ස්පාඤ්ඤය තුල පාලක සමාජවාදී පක්ෂයට සියයට 5ක් ඡන්ද අහිමි වූ අතර එම පක්ෂය දක්ෂිනාංශික මහජන පක්ෂයටත් වඩා පහතට ඇද වැටුනි. ජර්මනිය තුල, වසර 11ක් පුරා ආන්ඩු බලය හෙබවූ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ (එස්පීඩී) සියයට 21ක් ඡන්ද ලබා ගනිමින් ඓතිහාසිකව පහල ම මට්ටමකට ගිලී ගියේ ය. පෘතුගාලයේ පාලක සමාජවාදී පක්ෂය ලත් සහාය සියයට 45ක සිට සියයට 27ක් දක්වා පහත වැටුනි.

පසුගිය වසර 7 පුරා ප්‍රන්සයේ විපක්ෂය වශයෙන් ක්‍රියා කල සමාජවාදී පක්ෂයට ලැබුනු ඡන්ද ප්‍රමානය සියයට 17ක් විය. වසර 5 කට පෙර තත්ත්වය හා සසඳන විට මෙය සියයට 12ක පිරිහීමකි. ඉතාලියේ දී ඉතාලි කොමියුනිස්ට් පක්ෂය හා අනිකුත් 'වාම' පක්ෂවල අනුප්‍රාප්තික සංවිධානයක් වූ ඩිමොක්‍රැටික් පක්ෂය ලත් සහාය සියයට 31ක සිට සියයට 26ක් දක්වා පහත වැටුනි. ඩෙන්මාර්කය තුල විරුද්ධ පාක්ෂික සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ට ඡන්දවලින් සියයට 12ක් අහිමි වූ අතර අවසන දී ඔවුන්ට ලැබුනු මුලු ඡන්ද ප්‍රමානය සියයට 21ක් විය. ඕලන්ද කම්කරු පක්ෂය ලැබූ ඡන්ද ප්‍රමානය අඩකින් ක්ෂය වී ගොස් සියයට 12ක් බවට පත් විය. ඔස්ට්‍රේලියාවේ දී එය සියයට 33ක සිට සියයට 24ක් දක්වා පහත වැටුනි.

මෙම පිරිහීම වඩාත් අපූර්ව සිදුවීමක් ලෙස සැලකිය හැක්කේ 1930 ගනන්වලට අනතුරුව ඇති වූ අතිශය දරුනු ලෝක ආර්ථික අර්බුදය මධ්‍යයෙහි මැතිවරනය පවත්වන ලද බව මෙනෙහි කරන විටය. විරැකියාව වේගයෙන් ඉහල යමින් තිබුන ද, ජනගහනයෙන් පුලුල් ස්තරවල ජීවන තත්ත්වයන් සැලකිය යුතු ලෙස නරක අතට පෙරලී තිබුන ද ඡන්ද දායකයෝ බුරුතු පිටින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් අත්හැර දමා යති.

මෙම මාරුවෙහි හේතු කාරකය පිහිටා ඇත්තේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල දේශපාලනය හා ගති ලක්ෂනයන් තුල ය. මෙම පක්ෂ වසර බොහෝ ගනනක් තුල වෙනත් ඕනෑම ධනේශ්වර පක්ෂයක් ලෙස ක්‍රියාත්මක වී ඇත. පසුගිය දශක දෙක තුල තත්වාරක්ෂක ආන්ඩු මගින් දැවැන්ත ප්‍රතිරෝධයන් අවුලුවා ලන ලද සමාජ ප්‍රහාර දියත් කිරීමට උත්සාහ දැරූ අවස්ථාවල වෘත්තීය සමිති සමග සමීප සන්ධානයකින් යුතුව ක්‍රියා කිරීමට මෙම පක්ෂ සිය බලපෑම් යොදාගෙන තිබුනි.

බ්‍රිතාන්‍ය තුල ටෝනි බ්ලෙයාර් විසින් නායකත්වය දරන ලද කම්කරු පක්ෂය, කොන්සවේටිව් පක්ෂයේ "අයෝමය කාන්තාව" ලෙස හඳුන්වන ලද මාග්‍රට් තැචර්ගේ වැඩ පිලිවෙල ක්‍රියාවට නැඟීය. මේ අතර ගෙහාඩ් ශ්‍රෝඩර් විසින් නායකත්වය දරන ලද

ජර්මනියේ එස්පීඩීය සුබසාධන විරෝධී හාට්ස් නීති සම්මත කර ගෙන කලින් තිබූ සියලු කොන්සර්වේටිව් පක්ෂවල ආන්ඩු එකතුව ක්‍රියාත්මක කලාට වඩා සමාජ අයිතීන් මත ප්‍රහාර එල්ල කලේ ය.

ධනවාදය පිලිබඳව වර්ධනය වන පොදු ජන කලකිරීමක තත්ත්වයන් යටතේ සමාජවාදය සමග ඓතිහාසික වශයෙන් සබඳකම් ඇති පක්ෂ ලත් දැවැන්ත මැතිවරන පරාජයන් අතර ඇතිවූවා සේ පෙනුනු විශමතාවය කෙරේ ජූනි 09 දින කතුවැකියකින් බ්‍රිතාන්‍යයෙහි ෆිනෑන්ෂල් ටයිම්ස් පුවත්පත අවධානය යොමු කලේ ය. ඇත්ත වශයෙන් ම, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා කොන්සවේටිව් පක්ෂවල ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති අතර වැදගත් වෙනස්කම් කිසිවක් නොමැති බව එම කතුවැකිය නිවැරදිව සටහන් කලේ ය. එම පුවත්පත මෙසේ ද ලිවීයඃ "'ධනවාදයෙහි අවසානය' බැරෑරුම් ශක්‍යතාවක් ලෙස මතු කෙරෙන අවධියක, ධනවාදය වෙනුවට සමාජවාදය ආදේශ කිරීම සිය ඓතිහාසික මෙහෙවර කොට ගත් පක්ෂ පාලනයේ දර්ශනවාදයක් ඉදිරිපත් නොකරති. එම පක්ෂවල අර්බුද විරෝධී ප්‍රතිපත්ති සිය ප්‍රතිමල්ලවයන්ගේ එවන් ප්‍රතිපත්තිවලින් වෙන් කොට හඳුනා ගත නොහැකි තරම් ය."

අද දින සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල නායකත්වය තුල එකදු කම්කරුවකු සොයාගත නොහැකි තරම් ය. පක්ෂ සාමාජිකත්වය තුල ද සිටිනුයේ ශීඝ්‍රයෙන් අඩුවන කම්කරු සංඛ්‍යාවකි. මෙම පක්ෂවලට බැඳෙන බොහෝ අය ද එසේ කරනුයේ සිය දේශපාලන පරමාදර්ශ මුදුන්පත් කර ගැනීමේ අපේක්ෂාවෙන් නොව, සිය වෘත්තීය ප්‍රගමනය වැඩි දියුනු කර ගැනීමේ අපේක්ෂාවෙනි. අවස්ථාවාදය, පූර්න වශයෙන් ප්‍රතිපත්තිගරුක නොවීම හා කම්කරු පන්තිය කෙරේ දක්වන අහංකාරකම මෙම සංවිධාන තුල උසස් වීමට ඇති ඉතාමත් වැදගත් පූර්වාවශ්‍යතාවන් වේ.

ජර්මනිය තුල, එස්පීඩී තුල ක්‍රියාකාරී අයෙකු වීම සලකනු ලබන්නේ රජයේ සේවාවෙහි හෝ පෞද්ගලික ආර්ථිකයෙහි හොඳ වැටුපක් ලැබිය හැකි රැකියාවකට පැන ගත හැකි පිනුම් පිත්තක් ලෙස ය. හිටපු එස්පීඩී සභාපති රුඩොල්ෆ් ස්කාර්ව් අද දවසේ ව්‍යාපාරික උපදේශකවරයෙකි. ඔහුගේ සේවා දායකයින් අතර සර්බිරස් සුරකුම් අරමුදල හා ප්‍රකෝටිපතිනි මාරියා - එලිසබෙත් හැෆ්ලර් ද වෙත්. දිගු කාල පරිච්ඡේදයක් තුල එස්පීඩීයට නායකත්වය දුන් හිටපු චාන්සලර් ශර්ඩර් සමාගම් අධ්‍යක්ෂ මන්ඩල තුල තනතුරු ගනනාවක් හෙබවීය. - ඉන් වඩාත්ම ප්‍රසිද්ධියට පත් එකක් නම් ලොව විශාලතම බල ශක්ති ආයතනය වන රුසියාව තුල සංකේන්ද්‍රිත ගෑස් ප්‍රොම් ආයතනයෙහි ඔහු දැරූ තනතුරයි.

ආර්ථික අර්බුදයක් මධ්‍යයේ දස ලක්ෂ සංඛ්‍යාත කම්කරු ජනකායක් සමාජ ප්‍රජාතන්ත්‍රවාදයට පිටුපාන විට, ඉන් පෙන්නුම් කෙරෙන්නේ එක දෙයකිඃ මෙම පක්ෂවලින් සියලු ගැටලුවලට විසඳුම් ඔවුහු තව දුරටත් අපේක්ෂා නොකරන බවයි.

තව ද ඡන්ද ප්‍රතිඵලය මගින් ප්‍රකාශිත වූයේ යුරෝපීය පාර්ලිමේන්තුව පුලුල් ලෙස ප්‍රතික්ෂේප කිරීමකි. පාර්ලිමේන්තුවෙහි කාර්යභාරය වූ කලී යුරෝපා සංගමයෙහි ආයතනවලට හා බ්‍රසල්ස්හි ඉහල වැටුප් ලබන 40,000කින් සමන්වත නිලධාරි හමුදාවට ව්‍යාජ-ප්‍රජාතාන්ත්‍රීය ආවරනයක් සැපයීම ය. මෙම නිලධාරී හමුදාව පිලිවෙලින් ඊට සමාන කල හැකි ව්‍යාපාරික උද්ඝෝෂකයන් හමුදාවක අන පරිදි ඔවුනට සේවය කිරීමට සැදී පැහැදී සිටී.

විශේෂයෙන් කම්කරු පන්තික ඡන්ද දායකයන් විශාල සංඛ්‍යාවක් ඡන්දය දැමීමෙන් වැලකී සිටියහ. මැතිවරනය තුල විශාලතම පක්ෂය ඡන්දය නොදුන් අයගේ පක්ෂය විය. ඡන්ද දායක සහභාගිත්වය සියයට 43ක ප්‍රතිශතයක් විය. එය 2004 වසරේ දී කලින් වාර්තාගත පහලම මට්ටමටත් වඩා සියයට 2.5කින් අඩු වීමකි. ඕලන්දය, මහා බ්‍රිතාන්‍යය හා නැගෙනහිර යුරෝපීය රටල් තුල ඡන්දය දීමට ඉදිරිපත් වූ ප්‍රතිශතය සියයට 40කට වඩා අඩුවිය.

මෙහ ප්‍රතිඵලය වශයෙන් ඇතිවූ දේශපාලන රික්තය ප්‍රයෝජනයට ගන්නා ලද්දේ තත්ත්වාරක්ෂක හා දක්ෂිනාංශික පක්ෂ විසිනි. මේ තත්ත්වය යුරෝපය තුල "දකුනට හැරීමක්" ලෙස හඳුන්වා දීමට බොහෝ විස්තර විචාරකයින්ට මං පාදා දී ඇත. එවැනි නිගමනයක් අත්තනෝමතික ය. නොගැඹුරු ය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදයට තිබූ සහාය බිඳ වැටීම හා ඡන්දය ප්‍රකාශ කල සංඛ්‍යාවේ අඩු වීම යන තත්ත්වයන් සිය වාසියට හරවා ගැනීමට දක්ෂිනාංශික පක්ෂ සමත් වූ බව සැබෑ ය. එසේ වුව ද, බොහෝ අවස්ථාවල ඔවුහු සිය ඡන්ද ප්‍රමානය වැඩි කර ගැනීමට අසමත් වූ අතර ඇතැම් අවස්ථාවල සිය සහාය සැලකිය යුතු ලෙස පිරිහෙනු ද අත්විඳීය.

සැලකිය යුතු වාසි ලැබූ ඕලන්දයෙහි ගියර්ට් විල්ඩර්ගේ නිදහස් පක්ෂය (සියයට 17ක්) එක්සත් රාජධානියේ නිදහස් පක්ෂය (සියයට 17ක්) බ්‍රිතාන්‍ය ජාතික පක්ෂය (සියයට 6) වැනි අන්තවාදී දක්ෂිනාංශික අතිත් බියකින් පෙලෙන පක්ෂ පවා මෙ දෙරටෙහි ඡන්දය ප්‍රකාශ කල අඩු ප්‍රතිශතය වන සියයට 35 මත

පදනම්ව බලන කල, ලබා ඇත්තේ, ඔවුන් ලත් ප්‍රතිඵල වලින් ඉඟි කෙරෙන සහායට වඩා අඩු සහායක් බව පෙනී යයි.

යුරෝපීය මැතිවරනය පෙන්නුම් කරනුයේ තියුනු සමාජ ධ්‍රැවීකරනයකි. මේ දක්වා පාලක පන්තියට සමාජ අරගල මැඩ පැවැත්වීමට හැකි වී ඇත්තේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ හා වෘත්තීය සමිති මත පැහෙමිනි. මෙම සංවිධානවල පිරිහීමෙහි අරුත වනුයේ අනාගත පන්ති ගැටුම් වඩාත් විවෘත හා පුපුරන සුලු ස්වභාවයක් ගනු ඇති බවයි.

කම්කරුවන් එවැනි තත්ත්වයකට මුහුන දීමට සූදානම් විය යුතු ය. අති දක්ෂිනාංශික කන්ඩායම් මැතිවරන වාසි අනතුරු ඇඟවීමක් සේ සැලකිය යුතු ය. විප්ලවකාරී හා ජාත්‍යන්තර සමාජවාදී වැඩ පිලිවෙලක් මත පදනම් වූ තමන්ගේ ම පක්ෂයක් කම්කරු පන්තියට අවශ්‍ය වේ.

**පීටර් ශ්වාස් විසිනි**

© www.wsws.org